# දරුවන් උදෙසා බයිබලයක්

# දෙවියන් වහන්සේ ආබ්‍රහම් තුළ ඇති ආදරය පරීක්ෂා කර බලන සේක



**ඉදිරිපත් කරන්නා:** Edward Hughes

**නිදර්ශනය කරන්නා:** Byron Unger; Lazarus Alastair Paterson

**සකස්කරන්නා:** M. Maillot; Tammy S.

**පරිවර්ථනය කරන්නා**

**නිෂ්පාදනය කරන්නා:** Bible for Children
www.M1914.org

©2025 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනීමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.





එක් රාත්‍රියක දෙවියන් වහන්සේ ආබ්‍රහම් හට අමුතු ආකාරයේ අණක් දුන් සේක. ඒ, ආබ්‍රහම්, තම පුත්‍රයා වූ ඊසාක්ට, දෙවියන් වහන්සේටත් වඩා ආදරය කරනවාදැයි පරීක්ෂා කරනු පිණිසය.


"ඔබේ පුත් ඊසාක් රැගෙන, ඔහුව දවන පූජාවක් ලෙස මට පූජා කරන්නයැ" යි දෙවියන් වහන්සේ අණ කළ සේක. ඊසාක්ව පූජා කරන්න? ඔහුගේ පුතා පූජා කරන්න? එය ආබ්‍රහම් හට අපහසු කාර්යයක් විය. ඔහු ඔහුගේ පුත්‍රයාට බොහෝ සෙයින් ආදරය කළේය.
3
නමුත් ආබ්‍රහම්, තමන් හට තේරුම් ගන්නට නොහැකි අවස්ථාවක වුනත්, දෙවියන් වහන්සේ විශ්වාස කරන්නට ඉගෙන ගෙන සිටියේය. උදයේ ඔහු ඊසාක් සහ සේවකයින් දෙදෙනෙකු සමඟ පූජාව ඔප්පු කරන කන්දට ගියේය.
4
එසේ පිටත් වන්නට පෙර, ආබ්‍රහම් දවන පූජාව සඳහා දල්වනු පිණිස දර කැබළි කළේය. ආබ්‍රහම් දෙවියන් වහන්සේට කීකරු වීමට සැලසුම් කර තිබුණි.
5
දවස් තුනකට පසු ඔවුහු කන්දට ළං වූවෝය. "මෙතන ඉන්න" ආබ්‍රහම් ඔහුගේ සේවකයන්ට කීවේය. "අප ගොස් නමස්කාර කර නැවත එන්නම්යැ" යි ඔහු කීය. ඊසාක් දර රැගෙන ගියේය. ආබ්‍රහම් ගින්දර සහ පිහියක් රැගෙන ගියේය.
6
"දවන පූජාවට අවශ්‍ය බැටළුවා කොහිද?" ඊසාක් ඇසීය. "දෙවියන් වහන්සේ විසින්ම බැටළුවෙකු සපයනු ඇතැ" යි ආබ්‍රහම් පිළිතුරු දුන්නේය.
7
දෙදෙනා දෙවියන් වහන්සේ විසින් තෝරාගත් නියමිත ස්ථානයට පැමිණියෝය. එතැනදී ආබ්‍රහම්, දවන පූජාව ඔප්පු කරනු පිණිස අල්තාරයක් සාදා දර සකස් කළේය. ආබ්‍රහම් බොහෝ අල්තාර සාදා තිබුණේය. සැකයක් නැතිවම මෙය ඔහුට සාදන්නට අපහසුම වූ අල්තාරය වන්නට ඇත.
8


ආබ්‍රහම් ඊසාක් ගැටගසා, ඔහුගේ ආදරණීය පුත්‍රයා වූ ඔහුව අල්තාරය මත තැබුවේය. ආබ්‍රහම් සැබැවින්ම දෙවියන්වහන්සේට කීකරු වී ආදරණීය ඊසාක්ව පූජා කරන්නට සැරසුනාද? ඔහුගේ එකම පුතාව?
9


ඔව්! ආබ්‍රහම් අත තිබූ පිහිය ඉහළට එසවුවාම එහි තලය දිලිසුනේය. ඔහුගේ හදවත බිඳී යන්නට ඇත. නමුත් ආබ්‍රහම්, දෙවියන් වහන්සේට කීකරු විය යුතු බව දැනගෙන සිටියේය.
10


“නවත්වන්න” ස්වාමින් වහන්සේගේ දූතයා මහත් ශබ්දයකින් පැවසීය. “දැන් මම, නුඹ දෙවියවහන්සේට බිය බව දනිමි. මගෙන් නුඹේ පුත්‍රයා, නුඹේ එකම පුත්‍රයා වළක්වා නොගත්තේය.”
11


පඳුරක පැටලී ඉන්නා නොකැළැල් බැටළුවෙකු දුටු ආබ්‍රහම් ඊසාක් ලිහා ඔහු වෙනුවට ඒ බැටළුවා පූජා කළේය. සමහරවිට ඊසාක්, “මාගේ පියා පැවසූ ලෙසම දෙවියන් වහන්සේ සැපයූ සේක” යි සිතන්නට ඇත.
12


පියා හා පුත්‍රයා දෙදෙනා නමස්කාර කරන අතරතුර ස්වාමින් වහන්සේගේ දූතයා ආබ්‍රහම් අමතා කතා කළේය. “ඔබ කීකරු වූ නිසා ඔබේ දරුවන් තුළින් සියලු ජාතීන් ආශීර්වාද ලබනු ඇත.” යම් දවසක ජේසුස් වහන්සේ ආබ්‍රහම්ගෙන් පැවත එන්නන්ගෙන් උපදිනු ඇත.
13


ආබ්‍රහම් සහ ඊසාක් ආපසු නිවසට ආවෝය. ටික කලකට පසු කණගාටුදායක දෙයක් සිදුවුනි. සාරා මිය ගියාය. ආබ්‍රහම් හට තම බිරිඳ ද ඊසාක් හට තම මවද අහිමි විය.
14

අවමංගල්‍යයට පසු
ඊසාක්ට බිරිඳක් සොයන
පිණිස ආබ්‍රහම් තම ප්‍රධාන
සේවකයා යැවීය. සේවකයා,
ආබ්‍රහම්ගේ නෑදෑයින් අතරින් බිරිඳක්
සොයනු පිණිස ඔවුන් උපන් දේශයට ගියේය.



15

සේවකයා දෙවියන් වහන්සේගෙන් ලකුණක් ඉල්ලුවේය.
“මාගේ ඔටුවන්ට වතුර පිරිනමන තරුණිය ඊසාක් හට
සුදුසු තැනැත්තිය වේවා”. එසැණින්ම රෙබෙකා උන්ට වතුර
දෙන්නට ඉදිරිපත් වූවාය. ඇය ආබ්‍රහම්ගේ නෑයින්ගෙන්
කෙනෙකු වූවාය. දෙවියන් වහන්සේ තමාගේ යාච්ඤාවට
පිළිතුරු දුන් බව සේවකයා දැනගත්තේය.



16

රෙබෙකා ඊසාක් විවාහ කරගන්නා පිණිස ඇයගේ පවුලේ
අයගෙන් වෙන්ව ගියාය. ඔහුගේ මව මියගිය පසු ඇය ඔහු
සැනසුවාය. ඊසාක් ඇයට බොහෝ සේ ආදරය කළේය.



17

දෙවියන් වහන්සේ ආබ්‍රහම් තුළ ඇති ආදරය පරීක්ෂා
කර බලන සේක

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

උත්පත්ති 22-24

**“ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ”**
**ගීතාවලිය** 119:130

18




5

60

19

**මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.**

**දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැගිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.**

**මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.**

**ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.**

**දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)**

20